# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## නිමල් සිරිපාල ද සිල්වා පදනම
## (සංස්ථාගත කිරීමේ)

**නිමල් සිරිපාල ද සිල්වා පදනම සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා
විසින් 2012 මැයි මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2012 අප්‍රේල් මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[167 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# නිමල් සිරිපාල ද සිල්වා පදනම (සංස්ථාගත කිරීමේ)

## නිමල් සිරිපාල ද සිල්වා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"නිමල් සිරිපාල ද සිල්වා පදනම" යනුවෙන් හඳුන්වන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස කරගෙන යෑමේ අරමුණ ඇතිව මෙතෙක් කල් බදුල්ලේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, එම විවිධ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන හිතසුව පිණිස වන බැවින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2012 අංක දරන "නිමල් සිරිපාල ද සිල්වා පදනම පදනම" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

නිමල් සිරිපාල ද සිල්වා පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) නිමල් සිරිපාල ද සිල්වා පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) "නිමල් සිරිපාල ද සිල්වා පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එම නාමයෙන් සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් පොදු පරමාර්ථ සඳහා ද එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ:—

(අ) දුප්පත් පාසල් සිසුන්ට හා තරුණ තරුණියන්ට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු නොකඩවා කරගෙන යෑමට හැකිවීම සඳහා ආධාර ත්‍යාග හා ශිෂ්‍යත්ව ලබාදීම සහ ඔවුන්ගේ අධ්‍යාපනික සංස්කෘතික හා විද්‍යාත්මක කටයුතුවලට සහාය වීමට සහ ස්ථාවර සහ ජංගම පුස්තකාල ස්ථාපිත කිරීමට;

(ආ) පාසල් සිසුන්ගේ සහ තරුණ තරුණියන්ගේ අධ්‍යාපනික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ බලාපොරොත්තුව ඇතිව සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන, ප්‍රදර්ශණ, තරඟ විභාග සහ අධ්‍යාපනික චාරිකා සංවිධානය කිරීම, ඔවුන්ගේ ක්‍රීඩා සහ කලාත්මක කුසලතා යම් පිළිවෙළකට වැඩි දියුණු කිරීම සඳහා තරඟ හා පුහුණු කඳවුරු පැවැත්වීමත් නිපුණතා ඇති සිසුන්ට දේශීය හා විදේශීය සංචාර සඳහා ආධාර ලබා දීම හා ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය කිරීමට පියවර ගැනීමට ;

(ඇ) නායකත්වය සඳහා තැනැත්තන් පුහුණු කිරීම සහ තරුණ ශ්‍රමය පොදුජන සුභසාධනය උදෙසා යොදවා ගැනීමට ;

(ඈ) පාසල් හැර යන්නන්ගේ කලාත්මක නිර්මාණ ප්‍රවර්ධනයට, ක්‍රීඩා කුසලතා සහ කාර්මික ඥානය ප්‍රවර්ධනය කිරීමට වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම, එමෙන් ම පරිගණක විද්‍යාව සහ තාක්ෂණික අධ්‍යාපනයට පෙළඹවීමට උපකාර වනු පිණිස එවැනි අභ්‍යාසයන් සැපයීමේ ආයතන පිහිටුවීමට අවශ්‍ය පියවර ගැනීමට ;

(ඉ) විශ්වවිද්‍යාලවලට සහ කාර්මික විද්‍යාලවලට තෝරා ගනු ලබන සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානයෙන් උපකාරී වීම, රැකියා වියුක්ත තරුණ තරුණියන්ට ස්වයං රැකියා අවස්ථා තහවුරු කිරීම සහ ණය පහසුකම් සැපයීම සඳහා විවිධ ඉතිරි කිරීමේ යෝජනා ක්‍රම හඳුන්වා දීමට ;

(ඊ) දිළිඳු දරුවන්ගේ පූර්ව ළමාවිය සංවර්ධනය උදෙසා පෙර පාසල් ආරම්භ කොට පවත්වාගෙන යාමත්, වැඩිහිටියන්, පාසල් සිසුන්, පාසල් හැර යන්නන් උදෙසා විවිධ භාෂා සහ විවිධ විෂයයන් වෙනුවෙන් පන්ති ආරම්භ කර පවත්වාගෙන යෑම සහ ඔවුන්ට වෙනත් පහසුකම් සම්පාදනයට ;

(උ) ඉඩම් හා නිවාස හිමිකම නොමැති අයට ඉඩම් හා නිවාස ලබාදීම, ජල හිඟය පවත්නා ප්‍රදේශවල ජලසම්පාදන යෝජනා ක්‍රම ආරම්භ කිරීම, ස්වාභාවික ආපදාවන් වැළැක්වීමට හා අවම කිරීමට පියවර ගැනීම, අඩු පහසුකම් ඇති පාසල්වල ගොඩනැගිලි ලබාදීම, එවැනි පාසල්වල ඇති අනෙකුත් අග හිඟකම් සපුරාදීම, විවිධ ප්‍රදේශවල මාර්ග, විදුලිය සහ සෞඛ්‍ය වැනි යටිතල පහසුකම් සම්පාදනය කිරීමට;

(ඌ) ජාති, ආගම් හා කුල භේදවලින් තොරව අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික, සෞන්දර්ය, විද්‍යා සහ ක්‍රීඩා පහසුකම් සංවර්ධනයට ආධාර කිරීම සහ විවිධ තරග සහ සංදර්ශන මෙහෙයවීමට ;

(එ) දිළිඳු අනාථ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍යාධාර සහ ආහාර සම්පාදනය, අවතැන්වූ තැනැත්තන්ට සහ වයෝවෘද්ධ වූවන් සඳහා නිවාස ආරම්භ කර පවත්වා ගෙන යෑම සහ ළමුන් සහ වයෝවෘද්ධ වූවන් සඳහා ළමා නිවාස හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කර පවත්වාගෙන යෑමට ;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ අරමුණ ඇතිව ප්‍රදර්ශන දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩමුළු, විවාද කණ්ඩායම් සකාච්ඡා, සංචාර, විනෝද චාරිකා හෝ වෙනත් එවැනි ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, සැලසුම් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය එවැනි පොත් වාර ප්‍රකාශන, පත්‍රිකා හා ප්‍රවෘත්ති පත්‍ර මුද්‍රණය කිරිම ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීමට ;

(ඔ) අඳ, ගොළු, බිහිරි, ආබාධිත, වයෝවෘද්ධ, අවතැන් වූ අයට පහසුකම් සැලසීම සඳහා නිවාස ආරම්භ කොට පවත්වාගෙන යාමට ද ; සහ

(ඕ) සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය ආයතන සමඟ සහයෝගීව කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) මෙම පනතේ අනෙකුත් විධිවිධාන යටත්ව සහ තත්කාලයෙහි සංස්ථාවේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සභාපති, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික හා වෙනත් නව දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සංස්ථාවේ කටයුතු පාලනය කරනු ලැබිය යුත්තේ ය.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය, මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමජික නිල දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) සභාපතිවරයා හැර, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමජිකයකු මිය යෑම හෝ ඉල්ලා අස්වීම නිසා ඔහුගේ ධුරය කලින් අත් හළහොත් මිස, අවුරුදු හතරක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය. මිය යෑම හෝ ඉල්ලා අස්වීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වූ විට එම පුරප්පාඩුව පිරවීමට නව සාමාජිකයකු පත්කළ යුතු අතර, එම නව සාමාජිකයා අවුරුදු හතරක කාලයක් ධුරය දැරිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව සංස්ථාව සතු බලතල වන්නේ:—

(අ) සංස්ථාව වෙනුවෙන් යම නිශ්චල හෝ චංචල දේපලක් අත්කර ගැනීම, දැරීම හෝ ගැනීම හෝ සංස්ථාව සතු යම් නිශ්චල දේපලක් බදු දීම හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් අන්සතු කිරීම, ණයට බැදීම හෝ බැහැර කිරීම ;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු ආකාර ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට ඍජුව ම ඇතුළත්වීම, ඒවා ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම හෝ සංස්ථාව වෙනුවෙන් බලයලත් නිලධරයකු හෝ නියෝජිතයකු මගින් ක්‍රියාත්මක කරවීම ;

(ඇ) ත්‍යාග, පරිත්‍යාග සහ රික්තවරණ මුදලින් හෝ ද්‍රව්‍යවලින් භාර ගැනීම ;

(ඈ) සංස්ථාව විසින් සුදුසු යැයි අදහස් කරන ආකාරයේ ඇප මත මුදල් අත්තිකාරම් දීම හෝ ණයට දීම හෝ ණයට ගැනීම ;

(ඉ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, භාරයන් ඇතිකොට පරිපාලනය කිරීම සහ යම් බැංකුවක, ජංගම, තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම ;

(ඊ) පොත්, වාර ප්‍රකාශන, සඟරා සහ වනත් ලිපි ලේඛන පළ කිරීම හෝ පළ කිරීමට සැලැස්වීම සහ පුස්තකාල පොත් අලෙවිසල් සහ මුද්‍රණාල ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඨ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යෑම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වා ගැනීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ සේවා නියමයන් හා කොන්දේසි නියම කිරීම ; සහ

(ඩ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යෑමට අවශ්‍ය වන ආනුෂංගික හෝ යෝග්‍යවන වෙනත් එවැනි සියලු ක්‍රියා සහ දේවල් සමාන්‍යයෙන් කිරීම.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) නිලධරයන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල චර්යාව සහ කාර්ය;

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම එහි බලතල චර්යාව සහ කාර්යය. එම සාමාජිකයන්ගේ ධුර කාලය සහ එම සමාජිකයන්ගේ පුරප්පාඩු පිරවීම;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ නියෝජිතයගේ සහ සේවකයන්ගේ බලතල චර්යාව, කාර්ය හා කර්තව්‍ය ;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැදවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන හා රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම්කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන්ම සහ එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය.

**7.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වන දිනයට පදනමේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එම දිනයට පදනමට ගෙවීමට ඇති සියලු ණය, සාමාජික මුදල්, සම්මාදම් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුත්තේ ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, මීට ඉහත දී හෝ මින්මතු ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, සම්මාදම්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් භාරගනු ලබන සියලු මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකුවක හෝ බැංකු කීපයක සංස්ථාව නමින් වන ගිණුමක බැරට තැන්පත් කළ යුතු වන්නේ ය.

(2) මෙම පනත යටතේ වන කර්තව්‍ය, වගකීම් සහ එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා ඉෂ්ට කිරීමේ දී භාවිතයේ දී සංස්ථාව විසින් දරා ඇති ඕනෑ ම වියහියදමක් පියවීමට අවශ්‍ය සියලුම මුදල්, ප්‍රමාණ අරමුදලින් ගෙවිය යුත්තේ ය.

සංස්ථාව මගින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව.

**9.** මිලදී ගැනීම, ප්‍රදානය, බදු දීම, අන්තිම කැමති පත්‍රයකින් හෝ අන්‍යාකාරයකින් බැහැර කිරිම නිසා සන්තකයට පත්ව ඇති චංචල හෝ නිශ්චල ඕනෑම දේපලක් දැරීම හා අත්පත් කර ගැනීමට හැකියාව හා යෝග්‍යතාව නිත්‍යානුකූලව සංස්ථාවට ඇති අතර, එවැනි දේපල මෙම පනතේ අවශ්‍යතාවන් සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය. තව ද, තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත් ව ඒවා විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරිමට හෝ අන්‍යකාරයකින් බැහැර කිරීමට සංස්ථාවට සම්පූර්ණ බලතල ඇත්තේ ය.

සාමාජිකයන්ගේ වගකීම පිළිබඳ සීමාවන්.

**10.** සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා නිදහස් වීමේ කාර්යය සඳහා හෝ වෙනත් අන්‍ය කාර්යයක් සඳහා සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගස්තුව ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවනු ඇත.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර, ඒවා සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සහ ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම, සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ ගිණුම් හා විගණනය.

**12.** (1) සංස්ථාවට ලැබුණු සියලුම මුදල් සහ සංස්ථාව විසින් කරන ලද වියදම පිළිබඳව නිසි ලෙස ගිණුම් තබා ගැනීමට සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරුන් විසින් සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක් වරක්වත් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුත්තේ ය.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු ඉදිරිපිට දී හැරුණු විට සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි වගට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රය මත තම නම ලියා අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු ලෙස අන් අයෙකු අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.